
**සවියෙන් පෙරට අපි එකට**

**e- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | ඉතිහාසය | 3 | 5. අපේ අතීත රජවරු<br>V කොටස - වසභ රජතුමා |






**සැකසුම- කුෂානි අමල්කා ගුරුසිංහ**
**බප/හො/තක්ෂිලා ම.වි.**

# වසභ රජු (ක්‍රි.ව.67-111දක්වා)

***ජීවන තොරතුරු***

- ලම්බකර්ණ ගෝත්‍රයට අයත් පවුලක ඉපදී ළමාවිය උතුරු පළාතේ තම මාමාගේ නිවසේ කාලය ගත කරන ලදී.
- **ලම්බකර්ණ (අතීතයේ ලේඛන කටයුතු භාරව සිටි) රජ පෙළපතේ** ආරම්භකයා මොහුය.

# වසභ රජුගේ සේවාවන්

## වාරි කර්මාන්තය දියුණු කිරීම

- මහා පරිමාණ වැව් ඉදිකිරීමේ ආරම්භකයා වන්නේ වසභ රජුය

- විශාල පරිමාණයේ වැව් 11ක් හා වැව් වලින් කුඹුරු වලට ජලය ගෙන යාමට ඇළ මාර්ග 12ක් තනන ලදී.



# ඔහු විසින් සාදන ලද වැව්

| පැරණි නම | වත්මන් නම |
|---|---|
| මයෙන්ති වැව | මහවිලච්චිය වැව |
| මනාකැටි වැව | මානන්කට්ටිය වැව |
| වාතමංගණ වැව | නොච්චිපොතාන වැව |
| | හිරිවඩුන්න වැව |
| | කලාබළලු වැව |






# හිරිවඩුන්න වැව

රජයට අයත් වැව් වලින් ජලය ලබා ගන්නා අයගෙන් රජතුමා බදු අය කළ අතර එම මුදල් නැවත යෙදවූයේ වැව් ප්‍රතිසංස්කරණය සඳහාය.



# මානන්කට්ටිය වැව



# සැතපුම් 30ක් දුරට ජලය ගෙන යන ඇළහැර ඇළ  වසභ රජුගේ විශිෂ්ඨ නිර්මාණයකි



## උමං ජලමාතිකා ක්‍රමය

හෙවත්

**පොළව යටින් තැනූ නළමාර්ග**

මගින් ජලය ගෙන යාම ප්‍රථම වරට ආරම්භ කරන ලද්දේ වසභ රජුය

# වසභ රජුගේ පාලන තන්ත්‍රය

- ශ්‍රී ලංකාව **ප්‍රදේශ වලට බෙදා** ඒවායේ කටයුතු මෙහෙය වීමට රජයේ නිලධාරීහු පත් කළහ.

උදා- ඔහුගේ පාලන සමයේදී **යාපන ප්‍රදේශය** පාලනය සඳහා **ඉසිගිරි** නමැති ඇමතිවරයා පත්කල බව **වල්ලිපුරම් රන්පත්‍රයේ** සටහන්ව ඇත.

- ඔහුගේ බලය එවකට මුළු දිවයින පුරාම පැවති ඇති බවට සාධක හමුවේ. (ඔහුට අයත් සෙල්ලිපි දිවයිනේ සෑම තැනකින්ම හමු වී ඇත.)
- මෙතුමා අවුරුදු 44 ක් රට පාලනය කරන ලදී.

# නගර අලංකරණය හා ආරක්ෂාව

- අනුරාධපුර නගරයේ ආරක්ෂාවට හා අලංකාරය සඳහා ප්‍රාකාර බැම්ම උස්කොට බැඳීමට කටයුතු කරන ලදී.
- නගරයේ තැනින් තැන පොකුණු ඉදිකර ඒවාට වැව් වලින් ජලය ගලා යාමට සලස්වා ඒවායේ හංසයින් ඇති කිරීමට උපදෙස් දීම.

# බුදුදහම සඳහා කරන ලද සේවය

- ථූපාරාම දාගැබට වටදාගෙයක් ඉදිකිරීම.
- ඉසුරුමුණි විහාරයේ පොහොය ගෙයක් ඉදිකරවා භික්ෂූන් වහන්සේලාට පූජා කිරීම.
- තිස්සමහාරාමයේ පිහිටි සිතුල්පව්ව විහාරයේ දාගැබක් ඉදි කිරීම.
- රටේ නොයෙක් පළාත් වල තිබූ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.

# මෙම පාඩමෙන් ලබා ගත හැකි ආදර්ශ

පාලකයෙක් ලෙස එතුමා තුල:

**ධෛර්යවන්ත බව
**දූරදක්නා නුවණ
**විමසිලිවන්තව කටයුතු කිරීම   දක්නට ලැබේ

**සවියෙන් පෙරට අපි එකට**

**e- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | ඉතිහාසය | 3 | 5. අපේ අතීත රජවරු<br>V කොටස - වසභ රජතුමා<br>-- ඇගයීම-- |

**සැකසුම : කුෂානි අමල්කා ගුරුසිංහ, බප/හො/ තක්ෂිලා ම.වි.**

1. නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

(ඉසිගිරි , බදු ක්‍රමයක්, ඇළහැර, වල්ලිපුරම් රන්පත් ඉරුවේ, පරිපාලන ඒකක, ලම්බකර්ණ, උමංජලමාතිකා)

1. ................................ රජ පෙළපතේ ආරම්භකයා වන්නේ; වසභ රජුය.
2. සැතපුම් තිහක් ජලය ගෙන යන ........................... ඇළ, වසභ රජුගේ නිර්මාණයකි.
3. නානපොකුණු වලට ඇළවල් මගින් ජලය ගෙනයාම වෙනුවට පොළොව යටින් තැනූ නළ මාර්ගයෙන් ජලය ගෙනයාම ..............................ක්‍රමය ලෙස හැඳින්වේ.
4. වසභ රජුගේ රාජ්‍ය කාලයේ දී යාපන ප්‍රදේශය පාලනය සඳහා පත්කර යවන ලද්දේ ....................................නම් ඇමති වරයා බව......................... හි සඳහන් වේ.
5. මෙතුමා දේශීය ආදායම් ඉහළ දැමීම සඳහා ....................... හඳුන්වා දීමත්, පාලනයේ පහසුව සඳහා............................. ඒකක වෙන් කිරීමත් සිදු කරන ලදී.

2. පහත සඳහන් වැව් වලින් **වසභ රජු** විසින් ඉදිකරන ලද වැව් වෙන් කර ලියා, ඒවායේ අතීත නාමය ලියා දක්වන්න.

සොරබොර වැව, මහවිලච්චිය වැව, මහකනදරා වැව, ගිරිතලේ වැව, නොච්චිපොතාන වැව,

බසවක්කුලම වැව, හිරිවඩුන්න වැව, මනාකැටිය වැව, නාච්චදූව වැව, තබ්බෝව වැව,

කන්තලේ වැව, පදවිය වැව

| පැරණි නම | වත්මන් නම |
|---|---|
| | |
| | |
| | |
| | |

3. නගරය අලංකාර කිරීම සඳහා වසභ රජු අනුගමනය කරන ලද උපක්‍රම තුනක් ලියන්න.

I. ..........................................................................................................................

II. ..........................................................................................................................

III. ..........................................................................................................................

4. පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණද, වැරදි නම් × ලකුණද යදන්න.

1. මිණිපේ ඇළ වසභ රජු ගේ විශිෂ්ඨ නිර්මාණයකි. ( )
2. මහ වැව් තැනීම ආරම්භ කරන ලද්දේ වසභ රජු විසිනි. ( )
3. වසභ රජු විසින් පියංගුක තිස්ස විහාරය ඉදිකරන ලදී. ( )
4. වසභ රජු සාදන ලද වැව් සියල්ල පොළොන්නරු දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. ( )
5. මෙතුමා පාලනයේ පහසුව සඳහා රට පරිපාලන ඒකක වලට වෙන් කරන ලදී. ( )

**සවියෙන් පෙරට අපි එකට**

**e- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| **6** | **ඉතිහාසය** | **3** | **5. අපේ අතීත රජවරු**<br>**V කොටස - වසභ රජතුමා**<br>**-- පිළිතුරු--** |

**සැකසුම : කුෂානි අමල්කා ගුරුසිංහ, බප/හො/ තක්ෂිලා ම.වි.**

1.) 1. ලම්හකර්ණ

2. ඇළහැර ඇළ

3. උමංජලමාතිකා

4. ඉසිගිරි, වල්ලිපුරම් රන්පත් ඉරුවේ

5. බදු ක්‍රමයක් , පරිපාලන ඒකක

2.)

| **පැරණි නම** | **වත්මන් නම** |
|---|---|
| මයෙන්ති වැව | මහවිලච්චිය වැව |
| මානාකැටි වැව | මානන්කට්ටිය වැව |
| වාතමංගන වැව | නොච්චිපොතාන වැව |
| | හිරිවඩුන්න වැව |

3.) 1. අනුරාධපුර නගරය වටා ප්‍රාකාරයක් ඉදිකිරීම.

2. නගරයේ තැනින් තැන පොකුණු ඉදි කර ඒවාට වැව් වලින් ජලය ගලායාමට සැලැස්වීම.

3. එම පොකුණු වල හංසයින් ඇති කිරීමට උපදෙස් ලබා දීම.

4.) 1. ×

2. √

3. ×

4. ×

5. √